ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති සංස්කාරක 2021 මැයි 21

# ප්‍රවෘත්ති නිවේදනය

**ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2021 අප්‍රේල්**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**මුදල් අමාත්‍යාංශය**

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2021 අප්‍රේල් මාසයේ ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය (Headline Inflation) 5.5%ක් බව එහි වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය මාර්තු මාසයේ ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය 5.1%ක් ලෙස වාර්තා විය. 2021 අප්‍රේල් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 4.3%ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.2%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2020 අප්‍රේල් මාසයේ 5.9% ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 5.2%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 0.7%ක් විය. 2020 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2021 අප්‍රේල් මාසයේ ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එළවළු, සහල්, පොල්, කහ කුඩු, පොල්තෙල් සහ පරිප්පු යන ආහාර ද්‍රව්‍යවල පැවති ඉහළ මිල මට්ටම ය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2021 මාර්තු මාසයේ 142.1ක් වූ දර්ශකාංකය 2021 අප්‍රේල් මාසයේ 142.2ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2021 අප්‍රේල් මාසයේ දර්ශකාංකය 0.1ක වැඩිවීමක් එනම් 0.1ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.2%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.06%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකුවිට පොල්තෙල්, අළුත් මාළු, පළතුරු, කුකුළ් මස්, සහල්, මුං ඇට, කරවල, මයිසූර් පරිප්පු, කව්පි, සීනි, කඩල, සහ මිරිස් කුඩු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා විය. එසේ වුවත් පොල්, එළවළු, ලොකු ළූණු, රතු ළූණු, අමු මිරිස්, අර්තාපල්, බිත්තර, සියඹලා, කහ කුඩු සහ දෙහි යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2021 අප්‍රේල් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'රෙදිපිළි හා පාවහන්', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'ප්‍රවාහන' (*ලිහිසි තෙල්*) සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. තවද 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' කාණ්ඩයට අයත් අයිතමයන්ගේ සුළු මිල වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'සෞඛ්‍ය', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික', 'අධ්‍යාපන' සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවල මිල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යාමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2021 මාර්තු මාසයේ 4.3% සිට 2021 අප්‍රේල් මාසයේ 4.1% දක්වා අඩුවීමක් වාර්තා විය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) |
| 2020 | අප්‍රේල් | 134.8 | 136.9 | -0.3 | 0.7 | 5.9 | 3.2 |
| | මැයි | 135.4 | 137.9 | 0.4 | 0.7 | 5.2 | 3.7 |
| | ජූනි | 137.3 | 138.9 | 1.4 | 0.7 | 6.3 | 4.4 |
| | ජූලි | 137.3 | 139.4 | 0.0 | 0.4 | 6.1 | 4.5 |
| | අගෝ. | 137.8 | 139.9 | 0.4 | 0.4 | 6.2 | 4.6 |
| | සැප්. | 138.9 | 140.4 | 0.8 | 0.4 | 6.4 | 4.8 |
| | ඔක්. | 139.1 | 140.5 | 0.1 | 0.1 | 5.5 | 4.5 |
| | නොවැ. | 139.8 | 140.6 | 0.5 | 0.1 | 5.2 | 4.5 |
| | දෙසැ. | 141.2 | 140.5 | 1.0 | -0.1 | 4.6 | 4.7 |
| 2021 | ජන. | 142.1 | 141.0 | 0.6 | 0.4 | 3.7 | 4.2 |
| | පෙබ. | 142.8 | 141.3 | 0.5 | 0.2 | 4.2 | 4.1 |
| | මාර්තු | 142.1 | 141.8 | -0.5 | 0.4 | 5.1 | 4.3 |
| | අප්‍රේල් | 142.2 | 142.5 | 0.1 | 0.5 | 5.5 | 4.1 |